ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - VI වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2014/2015
දිලික්ත නීතිය - LWU4326
කාලය - පැය එකයි.

---

දිනය - 2015 නොවැම්බර් 16 වන දින        වේලාව - ප.ව.01.30- ප.ව. 02.30 දක්වා

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

01. "*res ipsa loquiter* - එනයින් ම අවබෝධ වේ නම් ආප්තය මගින් පැමිණිලිකරු විත්තිකරුගේ නොසැලකිල්ල ඔප්පු කිරීමක් නොවන අතර විත්තිකරු එසේ කළ බවට ආප්තය හුදු මග පෙන්වීමක් සිදු කරයි."

ඔබේ පිළිතුර සනාථ කිරීම සඳහා විනිශ්චිත නඩු තීරණ ගෙනහැර දක්වමින් ඉහත ප්‍රකාශය ඇසුරින් *res ipsa loquiter* ආප්තය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

02. කමල් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන ශිෂ්‍යයෙකි. පසුගිය සඳුදා උදෑසන විශ්වවිද්‍යාලයට යාම සඳහා ඔහු ගම්පොළින් බසයට නැග්ගේය. බසය ප්‍රමාද වී ගමන ආරම්භ කළ අතර ඒ නිසා බසයේ සිටි නිතිපතා ගමන් ගන්නා මගීන් කිපදෙනෙක්ට සේවයට යාමට ප්‍රමාද වී තිබුණි. මගීන් කීප දෙනෙක් විසින් රියදුරුගෙන් ඉක්මනින් බසය ධාවනය කරන ලෙස ඉල්ලා සිටි අතර රියදුරු වේගයෙන් බසය ධාවනය කිරීමට පටන් ගත්තේය. බසය කඳු පල්ලම් සහ වංගු සහිත මාර්ගයේ ගමන් කරමින් සිටියදී එක්වනම තිරිංග ක්‍රියාත්මක නොවන බවටත් ඔහුට රථයේ වේගය අඩු කර ගැනීමට නොහැකි බවටත් රියදුරු කෑ ගැසුවේය. බසයේ විවෘත දොරටුව අසල සිටගෙන සිටි කමල් සන්ත්‍රාසයට පත්ව බසයෙන් ඉවතට පැන්නේය. ඔහු කන්දෙන් පහළට පෙරලී ගොස් ගලක වැදීම නිසා තුවාල ලැබීය. කෙසේ වුවද බසයේ රියදුරු බස් රථය නවතා ගැනීමට සමත් විය. නමුත්, කමල් බසයේ රියදුරුට විරුද්ධව නඩු පැවරීමට අපේක්ෂා කරයි. කමල් විසින් බසයෙන් ඉවතට පැනීම නිසා තමා විසින්ම තුවාල සිදුකර ගත් බවට බස් රථයේ රියදුරු තර්ක කරයි.

සාකච්ඡා කරන්න. කමල්ට උපදෙස් ලබා දෙන්න. නඩු තීරණ ගෙනහැර දක්වමින් ඔබගේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LL.B DEGREE PROGRAMME – LEVEL 6**
**CONTINUOUS ASSESSMENT TEST II– 2014/2015**
**LWU4326 – LAW OF DELICT**
**DURATION: 01 HOUR.**

**DATE: 16th November 2015** **TIME: 1.30 p.m. – 2.30 p.m.**

**Answer one (01) question only**
**Candidates will be penalized for illegible handwriting.**

01. "The maxim *res ipsa loquiter* does not relieve the plaintiff of the burden placed upon him of proving the defendant's negligence, but is merely a method which may assist him in doing so".

    Discuss the maxim *res ipsa loquiter* in the light of the above statement citing case law in support of your answer.

**(20 marks)**

02. Kamal is a student who is studying at Peradeniya University. Last Monday morning he got on the bus to go to university from Gampola. The bus had started late and several regular passengers on the bus were late for work. Some passengers asked the driver to hurry and he started driving faster. When the bus was going downhill and round bends the driver suddenly shouted out that the brakes had failed and he could not slow down. Kamal who was standing near the open door panicked and jumped from the bus. He rolled down the hill and was injured when he hit a rock. However bus driver was able to stop the bus. But Kamal wishes to sue to bus driver. The bus driver argued that Kamal had caused his own injuries by jumping out of the bus.

    Discuss and advise Kamal. Support your argument citing case law.

**(20 marks)**

*-Copyrights reserved -*